ඔබේ පැමිණිල්ල සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර සමාගම විසින් දෙන ලද තීරණය ගැන සෑහීමකට පත් නොවන්නේ නම් හෝ කොටස් තැරැව්කාර සමාගම තීරණයක් ලබා දීම ප්‍රමාද කරයි නම් කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිළධාරීවරයා වෙත ඔබගේ පැමිණිල්ල ඕනෑම ලිඛිත ආකෘතියකින් (තැපැල්, විද්‍යුත් තැපෑල හෝ ෆැක්ස්) ඉදිරිපත් කළ හැකිය.

## කොළඹ කොටස් හුවමාරුවෙහි ස්වාධීන මණ්ඩලය වෙත පැමිණිලි කිරීම

ඕනෑම පාර්ශ්වයක් කොළඹ කොටස් හුවමාරුවේ ලේකම් කාර්යාලය විසින් දෙන ලද තීරණය ගැන සෑහීමකට පත් නොවන්නේ නම්, එම පාර්ශවයට කොළඹ කොටස් හුවහමාරුව විසින් පත් කර ඇති ස්වාධීන මණ්ඩලයක් වෙත නැවතත් අභියාචනා කළ හැකිය.

## කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් [CSE & Mobile App] පහසුකම

මෙම පහසුකම, ඔබ සතු ස්මාර්ට් ජංගම දුරකථනයකින් Google Play හෝ Apple Store වෙත පිවිසීමෙන් බාගත කර ගත හැකියි. අනතුරුව එහි සඳහන් පියවර අනුගමනය කරමින් ඉදිරියට යාමේදී ප්‍රථමයෙන් ඔබව එහි ලියාපදිංචිවීමක් සිදුවන අතර ඉන් පසු ඔබ සී ඩී එස් ගිණුමක් ආරම්භ කරගැනීමේ පියවර වෙත යා යුතු වේ. එහිදී ඔබ ඔබගේ ඊමේල් ලිපිනය, පෞද්ගලික විස්තර, පදිංචිය පිළිබඳ විස්තර, රැකියාව පිළිබඳ විස්තර හා බැංකු ගිණුම් විස්තර ඇතුළත් කළ යුතු වේ. එපමණක් නොව කොටස් තැරැව්කාර ආයතනයක් හා ආයෝජන උපදේශකවරයෙක් තෝරා ගැනීමටත් අවස්ථාව ඇත. මෙම සී ඩී එස් ගිණුම විවෘත කිරීමට අමතරව එම මොබයිල් ඇප් පහසුකම හරහා

- යාවත්කාලීන වෙළෙඳපොළ තොරතුරු
- ප්‍රස්ථාර සටහන්
- පර්යේෂණ තොරතුරු සහ දත්ත
- අනෙකුත් අධ්‍යාපනික තොරුතුරු
- විශ්ලේෂණ මෙවලම්
- සාංගමික තොරතුරු සහ වීඩියෝ දර්ශන
- තම ගිණුම සම්බන්ධ යම් වෙනසක් කිරීම

ආදී පහසුකම් රැසක් ලබාගත හැකියි. ඒ අනුව මෙම මොබයිල් ඇප් පහසුකම තුළ ආයෝජකයෙකුට දැනුවත් ආයෝජන තීරණ ගැනීමට අවශ්‍ය පහසුකම් රැසක් අන්තර්ගත කර ඇත.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

28 සහ 29 වන මහළ, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
එච්ලන් චතුරශ්‍රය
කොළඹ 01

දුරකථන +94 (11) 2143843
ෆැක්ස් : +94 2439149
ඊ-මේල් : mail@sec.gov.lk

වෙබ් අඩවිය: www.sec.gov.lk

secsocialmedia

SEC_SriLanka

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

# කොටස් වෙළෙඳපොළ

# ආයෝජනය හා සම්බන්ධ විවිධ ගිවිසුම් සහ ලිපි ලේඛන



## කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී, කොටස් තැරැව්කාර ආයතනය සමඟ ඇති කර ගන්නාවූ ගිවිසුම්, ගිණුම් වාර්තා සහ ඔබට ලැබන ලිපි ලේඛන පිළිබඳව ඔබ කොතරම් දුරට පරීක්ෂාකාරීද?

කොටස් වෙළෙඳපොළ ආයෝජනයට ඔබ නවකයකු විය හැකිය. එසේ නැතහොත් දැනට ආයෝජනයෙහි නිරත වන්නෙකු විය හැකිය. කෙසේ වෙතත් කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී ආයෝජකයකුගේ දැනුවත්භාවය කොතරම් වැදගත් ද යන්න ආයෝජනයේ සාර්ථකභාවය අනුව තේරුම් ගත හැකිය. ආයෝජනය කිරීමට ප්‍රථමයෙන් ඔබට ආයෝජනයේ ස්වභාවය පිළිබඳව පුළුල් අවබෝධයක් තිබීම ඉතා වැදගත්ය. වෙළෙඳපොළ තුළින් ඉහළ ප්‍රතිලාභයක් අපේක්ෂා කරන්නේ නම් කොටස් තැරැව්කාර ආයතනය සමඟ ඇතිකර ගන්නාවූ විවිධ ගිවිසුම්, වෙළෙඳපොළ විවිධ පාර්ශවකරුවන්ගෙන් ලැබෙන ලිපි, ලේඛන, මුල්‍ය වාර්තා ආදිය පිළිබඳවද හොඳින් දැනුවත්ව සිටිය යුතුය. ආයෝජකයකු වශයෙන් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු එවැනි ගිවිසුම්, වාර්තා ලිපි, ලේඛන ලෙස,

- ගනුදෙනුකරු හඳුනා ගැනීමේ ආකෘති පත්‍රය [KYC Form]
- ආයෝජක ගිවිසුම [Client Agreement]
- සී ඩී එස් ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය
- අභිමතය අනුව ගණුදෙනු කරන ගිණුම [Discretionary & Account]
- ණය ගිවිසුම [Credit Agreement]
- ගැනුම් සටහන්/විකුණුම් සටහන් [Bought & Note Sold& Note]
- මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් ලබාදන ගිණුම් වාර්තා
- ගිණුම් වාර්තා [statements of Accounts] ආදිය හඳුන්වා දිය හැකිය

## ගනුදෙනුකරු හඳුනා ගැනීමේ ආකෘති පත්‍රය [KYC Form]

එක් එක් ගනුදෙනුකරුවන්ගේ මුල්‍ය තත්වය, ආයෝජන අත්දැකීම්, සහ ආයෝජන අරමුණු මොනවාද යන්න සත්‍ය වශයෙන් දැන ගැනීම සහ පූර්ණ වශයෙන් හඳුනා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම කොටස් තැරැව්කාර ආයතනයක ප්‍රධාන වගකීමකි එම ආකෘති පත්‍රය මගින් පහත සඳහන් විස්තර ඉල්ලා සිටිය හැකිය.

- සම්පූර්ණ නම සහ ජාතික හැඳුනුම් පත් / විදේශ ගමන් බලපත් අංකය
- ලිපිනය සහ දුරකථන අංකය
- ලිපිනය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි
- රැකියාව සහ අනෙකුත් ව්‍යාපාර පිළිබඳ විස්තර
- ආයෝජනය කිරීම සඳහා අපේක්ෂිත මුදල
- අරමුදල් මූලාශ්‍රය

ඔබ ඉතිරිකිරීමේ ගිණුමක් හෝ ස්ථාවර ගිණුමක් විවෘත කරන විට ද මෙවැනි ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමට සිදු වේ. මෙම ආකෘති පත්‍රයෙන් අසා ඇති සමහර ප්‍රශ්ණ වලට පිළිතුරු දීමට සාමාන්‍යයෙන් ආයෝජකයන් මැලිකමක් දක්වයි. මෙහිදී මතක තබා ගත යුත්තේ මෙම විස්තර රැස්කිරීමේ පරමාර්ථය ඔබ විසින් ආයෝජනය කරන මුදල් නීත්‍යානුකූලව උපයා ගත් ඒවාද යන්න තහවුරු කර ගැනීම පමණි. මෙම ෆෝරමය සම්පූර්ණ කිරීම වර්තමානයේදී මොබයිල් ඇප් පහසුකම හරහා සී ඩී එස් ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස ඔන්ලයින් ආකාරයෙන් සම්පූර්ණ කිරීමට  කොටස් තැරැව්කාර ආයතන පහසුකම් සපයා ඇත.

## ආයෝජක ගිවිසුම [Client Agreement]

කොටස් තැරැව්කාර ආයතන වෙත කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති නීති අනුව ගනුදෙනුකරුවෙක් වෙත තම සේවා සැපයීමට ප්‍රථමව, කොටස් තැරැව්කාර ආයතනයක් ආයෝජක ගිවිසුම නමින් හඳුන්වනු ලබන ගිවිසුමකට එළඹිය යුතුයි. ආයෝජකයා විසින් එම ගිවිසුමේ ඇති සියලුම කොන්දේසි හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.

- ගනුදෙනුකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය
- කොටස් තැරැව්කාර ආයතනයේ සම්පූර්ණ නම සහ ලිපිනය මෙන්ම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් ලබා ඇති බලපත්‍රයේ තත්ත්වය
- කොටස් තැරැව්කාර ආයතනයේ සහ ගණුදෙනුකරු පිළිබඳ වැදගත් විස්තර වෙනස්වීම සම්බන්ධයෙන් එකිනෙකා දැනුවත් කිරීම් සම්බන්ධයෙන් දෙපාර්ශවයේ වගකීම්
- කොටස් තැරැව්කාර ආයතනය විසින් සපයනු ලබන සේවා පිළිබඳ විස්තර
- ගනුදෙනුකරු විසින් කොටස් තැරැව්කාර ආයතනය වෙත ගෙවිය යුතු කොටස් ගණුදෙනු පිරිවැය සහ අනෙකුත් ගාස්තු පිළිබඳ විස්තර
- අවදානම පැහැදිලි කිරීමේ ප්‍රකාශය
- අනෙකුත් සේවා සඳහා වන ගාස්තු ආදී විස්තර එම ගිවිසුමෙහි ඇතුළත් වේ.

මෙම විස්තර අතරින් අවදානම පැහැදිලි කිරීමේ ප්‍රකාශය පිළිබඳව ආයෝජකයකු විශේෂ අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍යයි. එහි සඳහන් එක් විශේෂ වගන්තියක් වන්නේ කොටස් මිල ගණන් උච්ඡාවචනය විය හැකි බවත් සමහර අවස්ථාවල එය ප්‍රබල ලෙස වෙනස් විය හැකි බවයි. මෙසේ අවදානම පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් යෙදීමෙන් අපේක්ෂා කරනුයේ වෙළෙඳපොළ තුළින් ස්ථාවර අදායමක් උපයා ගැනීමට හැකියාවක් නොමැති බවයි. එහෙත් වෙළෙඳපොළ පිළිබඳව නිසි අවබෝධයෙන් කටයුතු කළහොත් සහ දැනුවත් ආයෝජන තීරණ ගතහොත් ඔබගේ ආයෝජනයේ වටිනාකම නැතිවීමට ඇති හැකියාව ඉතා සීමිත වනු ඇත.

ඔබ අවදානම පැහැදිලි කිරීමේ ප්‍රකාශය සමඟ එකඟවීමත් සමඟ කොටස් තැරැව්කාර ආයතනයේ නියෝජිතයා විසින් ආයෝජනයෙහි පවතින අවදානම පිළිබඳව ඔබට පැහැදිළි කර දී ඇතැයි ඉන් තහවුරු වේ. එමෙන්ම අවදානම පැහැදිළි කිරීමේ ප්‍රකාශය කියවන ලෙසත්, ගැටළු සහිත තැන් ඇත්නම් ඒවා විමසා දැන ගන්නා ලෙසත්, ස්වාධීන ආයෝජන තීරණ ගන්නා ලෙසත් ඔබගෙන් ඉල්ලා සිටි බවටද ඉන් තහවුරුවීමක් සිදු වේ. වෙනත් ආකාරයකින් කිවහොත් එය නීතිමය කොන්දේසියක්ද වන අතර එයින් වෙළෙඳපොළ හැසිරීම පිළිබඳව ආයෝජකයාව දැනුවත් කිරීමට කොටස් තැරැව්කාර ආයතනය උනන්දු කිරීමක් සිදු වේ. කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් වර්තමානයේදී හඳුන්වාදී ඇති මොබයිල් ඇප් පහසුකම හරහා මෙම සියල්ල ඔන්ලයින් ආකාරයෙන් සම්පූර්ණ කිරීමට අවස්ථාව සළසා ඇත.

## ගැනුම් සටහන්/විකුණුම් සටහන්

ආයෝජකයකු විසින් කොටස් මිලදී ගැනීමේ ඇණවුමක් හෝ විකිණීමේ ඇණවුමක් භාර දුන් පසු එම ඇණවුම සාර්ථක වුයේද යන්න නිසි පරිදි තහවුරු කරන ක්‍රමය ගැනුම් සටහන හෝ විකුණුම් සටහනයි. එය අනිවාර්යයෙන්ම කොටස් තැරව්කාර ආයතනය විසින් ගනුදෙනුකරුට ලබා දිය යුතු අතර ගනුදෙනුව සිදු වු දිනයේම එම ගනුදෙනු විස්තර වාර්තා ආයෝජකයා වෙත ඊ-මේල් මගින් ආයෝජකයා වෙත ලබා දෙනු ඇත. එසේ ලැබෙන වාර්තාවක් ඔබට කිසිම අයුරකින් වෙනස් කිරීමක් කළ නොහැකි අතර එහි යම් වරදක් ඇත්නම් ඒවා කොටස් තැරැව්කාර ආයතනයේ අනුකූලතා නිලධාරීවරයා වෙත වහාම ලිකිතව දැනුම් දිය යුතුය.

## සී ඩී එස් ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය

කොළඹ කොටස් හුවමාරුව ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියත් සමඟ සී ඩී එස් ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම ඔන්ලයින් ආකාරයට ආරම්භ කිරීමට පහසුකම් සළසා දී තිබේ. ඒ අනුව වර්තමානය වන විට දැකගත හැකි විශේෂ ලක්ෂණයක් වනුයේ කොළඹ කොටස් හුවමාරුවේ ගණුදෙනු කිරීමට අපේක්ෂා කරන බොහෝ ආයෝජකයන් කොළඹ කොටස් හුවමාරුව අළුතින් හඳුන්වාදී ඇති "මොබයිල් ඇප්" පහසුකම භාවිතයෙන් තම ස්මාර්ට් ජංගම දුරකථනය හරහා සී ඩී එස් ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කිරීමයි. ආයෝජකයා විසින් සී ඩී එස් ගිණුමක් ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න  සහ එහි සඳහන් සියළු නීතිරීති හොඳින් කියවා තේරුම් ගත බවට තහවුරු වීමක්ද මෙම ගිණුම ආරම්භ කිරීමත් සමඟ සිදුවේ.

ඔබ වෙනුවෙන් ඔබගේ කොටස් ගිණුමට කොටස් භාර ගන්නා ලෙස කොළඹ කොටස් හුවමාරුවෙහි උප සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය වෙත අවසර ලබා දී තිබේ. ඒ අනුව ඔබ විසින් ගණුදෙනුවක් සිදු කළ විට එය නැවත අවලංගු කළ නොහැකියි. මේ අනුව සෑම විටම නිවැරදි සහ දැනුවත් ආයෝජන තීරණ ගැනීමට ආයෝජකයා උත්සාහ කළ යුතුය.

තවද කොටස් ගනුදෙනුවලදී මධ්‍යම තැන්පතු ක්‍රමය සමඟ කටයුතු  කිරීමට ඔබ ඔබගේ කොටස් තැරැව්කාර ආයතනයට එහි නියෝජිතයා වශයෙන් අවසර ලබා දී ඇත. එහිදී ගනුදෙනු කිරීමට ආයෝජකයාට කැමති කොටස් තැරැව්කාර ආයතනයක් ආයෝජකයා තෝරා ගත හැකිය.

## අභිමතය අනුව ගණුදෙනු කරන ගිණුම [Discretionary Account]

අභිමතය අනුව ගණුදෙනු කරන ගිණුම යනු, කොටස් තෝරා ගැනීම, මිලදී ගන්නා හෝ විකුණනු ලබන වේලාව සහ කොටස් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරන්නේ කුමන මිලකටද යන්න ඇතුළු සුරැකුම්පත් මිලදී ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් වන තීරණයන් ගැනීම, ආයෝජකයා විසින් තම ආයෝජන උපදේශකවරයා වෙත තම අභිමතය පැවරීමේ ගිණුමකි සමහර ආයෝජකයන්ට වෙළෙඳපොළ හැසිරීම් අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් වේලාවක් නොමැත. එවැනි ආයෝජකයන් තමන් වෙනුවෙන් ගණුදෙනු කිරීම සඳහා තම ආයෝජන උපදේශකවරයා වෙත අවසර ලබාදෙමින් මෙම අභිමතය පරිදි ගණුදෙනු කිරීමේ ගිණුමක් ආරම්භ කරයි. එම ගිවිසුමක පහත සඳහන් කොන්දේසි ඇතුළත් වේ.

- ආයෝජකයාගේ ආයෝජන අරමුණු පැහැදිළිව මෙම ගිවිසුමෙහි අන්තර්ගත කොට තිබිය යුතුය.
- ප්‍රධාන විධායක නිළධාරීවරයා හෝ කොටස් තැරැව්කාර ආයතනය විසින් අභිමතය පරිදි ගණුදෙනු කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබාදිය යුතුය.

මෙම ගිවිසුමට එළඹීමෙන් පසුව ඔබගේ අනුදැනුමකින් තොරව කොටස් ගණුදෙනු කිරීමට ඔබගේ ආයෝජන උපදේශකවරයාට හැකියාව ඇති. ඔබ වෙනුවෙන් එවැනි ගිවිසුමකට එළඹ නොමැතිව ඔබගේ ආයෝජන උපදේශකවරයාට තම අභිමතය පරිදි ගණුදෙනු කළ නොහැකියි. එවැනි ගිවිසුමකට ඔබ එළඹෙන්නේ නම් ප්‍රථමයෙන් එම ගිවිසුමෙහි සඳහන් සියළු කොන්දේසි ඔබ කියවිය යුතුය.

මෙහිදී ඔබ විශේෂයෙන්ම මතක තබාගත යුත්තේ අභිමතය පරිදි ගණුදෙනු කිරීමේ ගිණුමක් ඔබ තෝරා ගන්නා කොටස් තැරැව්කාර ආයතනය අනුව වෙනස් විය හැකි බවයි. එසේම මෙවැනි ගිවිසුමක් කොටස් තැරැව්කාර ආයතනය හෝ ගණුදෙනුකරු යන දෙපාර්ශවයේ ලිඛිත ලියවිල්ලක් මගින් අවසන් කළ හැකිය.

## ණය ගිවිසුම [Credit Agreement]

ඔබ කොටස් තැරැව්කාර ආයතනයෙන් ණයක් ලබාගෙන වුවද කොටස් මිලදී ගැනීමට හැකියාව පවතී. යම් කාලයක් සඳහා එසේ ණයක් ලබාදීමේදී ආයෝජකයා සහ කොටස් තැරැව්කාර ආයතනය අතර ඇති කර ගන්නා වූ නීතිමය ගිවිසුම ණය ගිවිසුම ලෙස හඳුන්වයි. එසේ ණය ලබා ගැනීම අනිවාර්ය වූවක් නොවේ. මෙසේ ණය මත ආයෝජනය කිරීමේදී ඒ හා සම්බන්ධ සියළු නීති සහ රෙගුලාසි මෙම ණය ගිවිසුමෙහි අන්තර්ගත කර ඇත. මෙහිදී ඔබ මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ ණය ලබාගෙන ආයෝජනය කිරීම, කොතරම් දුරට ලාභදායීද යන්න සොයා බැලීමයි. මේ නිසා ඔබට දැරීමට හැකි ප්‍රමාණයට ණය ලබාගෙන ආයෝජනය කිරීමට උත්සාහ කළ යුතුය.

## ගිණුම් වාර්තා [Statement& of Accounts]

කොටස් වෙළෙඳපොළ තුළ සිදු කරන කොටස් ගණුදෙනු සඳහා බේරුම් කිරීම, ගණුදෙනු දිනයට පසු එළඹෙන ගණුදෙනු දින 3ක් ඇතුළත සිදු කළ යුතුය. විශේෂයෙන්ම කොටස් මිලදී ගැනීමක් සිදු කර දින 3ක් ඉක්මවා යාමෙන් අනතුරුව හිඟ පියවීමට නියමිත සියළු ගණුදෙනුකරුවන්ට ඔවුන්ගේ කොටස් ගිණුමෙහි ඇති සුරැකුම්පත් සම්බන්ධ වාර්තාවක් මාසය අවසාන වී එළඹෙන දින 7ක් ඇතුළත ඔවුන් වෙත යවනු ඇත. ඉහතින් දැක් වූ ආකාරයෙන් මාසයක් ඇතුළත ගණුදෙනු කර හිඟයන් පියවීමට නියමිත සියළු ගිණුම් හිමියන්ට මෙය අදාළ වන අතර ප්‍රමාද වී බේරුම්කරණය සිදු කරන්නන්ට අමතර පොළියක් ගෙවීමට ද සිදු වේ.

## මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් ලබාදන ගිණුම් වාර්තාව

කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කරන සියළු පුද්ගලයින්ගේ කොටස් ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ මධ්‍යම තැන්පතු ක්‍රමයයි. එම ගිණුම්වල එක් එක් ආයෝජකයින් විසින් මිලදී ගෙන ඇති කොටස් තැන්පත් කර ඇති අතර ආයෝජකයා විසින් එම කොටස් නැවත අලෙවි කරන තෙක් එහි භාරකරු ලෙස මධ්‍යම තැන්පතු ක්‍රමය ක්‍රියාත්මක වෙයි. කිසියම් ආයෝජකයකු අදාළ මාසය තුළ යම් ගණුදෙනුවක් සිදු කලේ නම් එවැනි ආයෝජකයින්ට ගිණුමෙහි ඇති කොටස් ප්‍රමාණයන් කොපමණද යන්න පිළිබඳ ගිණුම් ශේෂය හා සම්බන්ධ විස්තර වාර්තාවක් ආයෝජකයාට නොමිලේ ලැබීමට සලස්වයි. එසේම කිසියම් ආයෝජකයෙකුට අවශ්‍ය නම් මොබයිල් ඇප් පහසුකම හරහා ද ගෙවීම් සිදුකර මෙම වාර්තාව ලබා ගැනීමටත් අවස්තාව ඇත. මෙම වාර්තාව මගින් ගැනුම් සටහන හෝ විකුණුම් සටහනෙහි සඳහන් විස්තරවල නිරවද්‍යතාවය පිළිබඳවද තහවුරු කර ගත හැකිය. එය ඊ-මේල් මගින් ආයෝජකයා වෙත ලබා දෙයි.

## කොටස් තැරැව්කාර සමාගම්වලට එරෙහිව පාරිභෝගික පැමිණිලි

සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර සමාග මකට එරෙහිව පැමිණිල්ලක් කිරීමට ඔබට අවශ්‍ය නම්, ඔබ මුලින්ම පැමිණිල්ල ලිඛිතව කොටස් තැරැව්කාර ආයතනයේ අනුකූලතා නිලධාරියා වෙත ගැටළුවක් ඇති බවට අනාවරණය කර ගත් සැණින් දැනුම් දිය යුතුය.